(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 146.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2017 පෙබරවාරි මස 09 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

387/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2015 වර්ෂයේදී යුධ හමුදාවට ශාරීරික අභ්‍යාස සඳහා අවශ්‍ය කැන්වස් සපත්තු මිලදී ගැනීමට ටෙන්ඩර් කැඳවූ අවස්ථාවේ ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ ආයතන කවරේද;

(ii) එම ආයතන ඉදිරිපත් කළ ටෙන්ඩර් වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ටෙන්ඩරය ලබාගත් ආයතනය කවරේද;

(iv) එම ආයතනයට ටෙන්ඩරය ලබාදීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේදී මෙම සපත්තු මිලදී ගැනීමට අදාළ ආරක්ෂක අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සිටි නිලධාරින්ගේ නම් හා තනතුරු කවරේද;

(ii) මෙම නිලධාරින් ටෙන්ඩර් මණ්ඩලයේ කොපමණ කාලයක සිට කටයුතු කරන්නේද;

(iii) 2015 වර්ෂයේදී මෙම සපත්තු මිලදී ගැනීමට අදාළ යුධ හමුදා ටෙන්ඩර් මණ්ඩලයේ සිටි නිලධාරින්ගේ නම් හා තනතුරු කවරේද;

(iv) මෙම නිලධාරින් ටෙන්ඩර් මණ්ඩලයේ කොපමණ කාලයක සිට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ආරක්ෂක අමාත්‍යාංශය හා යුධ හමුදා ටෙන්ඩර් මණ්ඩලවල අඛණ්ඩව සේවය කරන නිලධාරින් ඉවත් කිරීමට රජය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයකදීද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

919/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොල්ලුපිටිය, හයට් හෝටල් (Hyatt Hotel) සංකීර්ණය ඉදිකරන ඉඩමේ වර්ග ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම ලබාගෙන ඇත්තේ බදු පදනමින්ද;

(iii) එසේ නම්, ඒ කවර ආයතනයෙන් කවර කාලයකටද;

(iv) එම ඉඩමේ තක්සේරු වටිනාකම කවරේද;

(v) එම ඉඩමේ බදු වටිනාකම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හෝටලය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ඉදිරිපත් වූ කොන්ත්‍රාත්කරුවන් හා ඔවුන් ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අත්සන් කළ දිනය කවරේද;

(v) ඒ සඳහා උත්සවයක් පවත්වනු ලැබුවේද; එසේ නම්, එහි වියදම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉදිකිරීම් සඳහා විදේශීය ඉංජිනේරු උපදේශක සේවා ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, එම ආයතනය කවරේද;

(iii) ඒ සඳහා ගෙවූ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

959/’16

ගරු බිමල් රත්නායක මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය විශ්වවිද්‍යාලයේ දැනට ක්‍රියාත්මක පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එහි ක්‍රියාත්මක දෙපාර්තමේන්තු සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් පීඨවල සහ දෙපාර්තමේන්තුවල සිටිය යුතු ස්ථිර ආචාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ස්ථිර ආචාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තිබේද;

(v) එසේ නම්, පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් පීඨය සහ දෙපාර්තමේන්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

998/’16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 1972 සිට 2009 දක්වා කාලය තුළ දෙමළ බෙදුම්වාදී ත්‍රස්තවාදය හේතුකොට ගෙන මියගිය සහ තුවාල ලැබූ ශ්‍රී ලංකා පොලිසියේ සාමාජිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1108/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 07, මේට්ලන්ඩ් පෙදෙසේ, අංක 55/2/T/85 දරන ස්ථානයෙහි පදිංචි ඒ. සමීර පුෂ්පකුමාර මහතාගේ දරුවා සහෝදර පදනමින් කොළඹ රාජකීය විද්‍යාලේ, 1 වැනි ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා ඉල්ලුම් කිරීමෙන් පසු, සම්මුඛ පරීක්ෂණයට කැඳවා ලකුණු 62ක් ලබාදුන් බවත්;

(ii) සහෝදර පදනමින් ඇතුළත් කරගැනීම සඳහා අවශ්‍ය ලකුණු ප්‍රමාණය 44 ක් වුවත්, ඉහත කී අයගේ දරුවා ලකුණු 62ක් ලබා තිබියදීත් පාසලට ඇතුළත් කර නොගත් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) මෙම දරුවාට සිදුවී ඇති අසාධාරණය පිළිබඳව සළකා බලා ඔහු රාජකීය විද්‍යාලයේ 1 වැනි ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1111/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය නිසා බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාව විශාල ලෙස පීඩාවට ලක්වී ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, පීඩාවට ලක් වී ඇති පවුල් සංඛ්‍යාව සහ ඔවුන් අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම සංවර්ධන ව්‍යාපෘතිය සිදුකිරීමට පෙර පරිසර ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් ලබාගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් ලබාදී ඇති තීන්දුවට අනුව අදාළ පුද්ගලයන්ට සහන ලබාදීමට අමාත්‍යාංශය කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1140/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවුර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) එරාවුර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාම නිලධාරි වසම්වල නිල අංකයන් හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එරාවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එරාවූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරි වසම් අතරින් කිසියම් වසමක/වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු කරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරි වසම්වල නම්, නිල අංකයන් ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1151/'16

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ ප්‍රදේශයෙන් බැහැර කරනු ලබන කැළිකසළ ජා ඇල ප්‍රදේශයට ගෙන ගොස් දැමීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එවැනි පියවර නිසා ප්‍රදේශයේ ජල මූලාශ්‍රවලට සහ ජන ජීවිතයට විශාල හානියක් සිදුවන බව පිළිගන්නේද;

(iii) ජා ඇල ප්‍රදේශයේ ජනතාවට අධික පීඩනයක් ගෙන දෙන මෙම ව්‍යාපෘතිය නවතා දැමීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1168/'16

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාවලපිටිය මැතිවරණ බලප්‍රදේශයට අයත් උලපනේ පිහිටි කර්මාන්තපුරය ආරම්භ කිරීම සඳහා පසුගිය රජය විසින් වෙන්කළ මුදල කොපමණද;

(ii) එහි කර්මාන්ත ශාලා කොපමණ ප්‍රමාණයක් ආරම්භ කර ක්‍රියාත්මක වූයේද;

(iii) මේ වනවිට වැසී ගොස් ඇති කර්මාන්තශාලා ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ)(i) හි සඳහන් කර්මාන්තපුරය යළි නගා සිටුවීමට නව වැඩපිළිවෙළක් සකස් කර තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1264/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍ය කාර්ය මණ්ඩලයට පත් කර ඇති,

(i) සම්බන්ධීකරණ ලේකම්වරයන්;

(ii) උපදේශකවරයන්;

(iii) අනෙකුත් කාර්ය මණ්ඩල;

සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමස්ත කාර්ය මණ්ඩලය කොපමණද;

(ii) සමස්ත කාර්ය මණ්ඩලය සඳහා මාසිකව වෙන් කර ඇති දීමනා, වැටුප්, වාහන, ඉන්ධන හා අනෙකුත් සියලුම වරප්‍රසාද ඇතුළත් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

539/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 වනවිට ශ්‍රී ලංකාවේ කුරුඳු වගා කරනු ලැබූ භූමි ප්‍රමාණය කොපමණද;

(ii) 2010 සිට 2015 දක්වා වසර පහ තුළ කුරුඳු නිෂ්පාදනය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කිලෝග්‍රෑම් කොපමණද;

(iii) රජය විසින් ගොවීන්ගෙන් සෘජුවම කුරුඳු මිලදී ගන්නේද;

(iv) එසේ නම්, පසුගිය වසර පහ තුළ රජය විසින් මිලදී ගත් කුරුඳු ප්‍රමාණය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුරුඳු නිෂ්පාදනය ඉහළ නැංවීමට රජය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

960/'16

ගරු බිමල් රත්නායක මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සබරගමුව විශ්වවිද්‍යාලයේ දැනට ක්‍රියාත්මක පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එහි ක්‍රියාත්මක දෙපාර්තමේන්තු සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් පීඨවල සහ දෙපාර්තමේන්තුවල සිටිය යුතු ස්ථිර ආචාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ස්ථිර ආචාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තිබේද;

(v) එසේ නම්, පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් පීඨය සහ දෙපාර්තමේන්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1000/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 මැයි 19 දිනට උතුරු පළාතේ පැවැති යුද, නාවික සහ ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව සහ ඒවායේ භූමි ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015 ජනවාරි 08 දිනට උතුරු පළාතේ පැවැති යුද, නාවික සහ ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව සහ ඒවායේ භූමි ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2016 සැප්තැම්බර් 30 දිනට උතුරු පළාතේ පැවැති යුද, නාවික සහ ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව සහ ඒවායේ භූමි ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1131/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) (වෛද්‍ය) නෙවිල් ප්‍රනාන්දු ආයෝජන පෞද්ගලික සමාගම ශ්‍රී ලංකාව තුළදී වෛද්‍ය උපාධිය පිරිනැමීම සඳහා අවසරය ඉල්ලා තිබේද;

(ii) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඒ සඳහා අවසරය ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

(iv) අවසර ලබා දීමේ ලිපිය සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රුසියාවේ, නිෂ්නි නොව්ගොරොද් රාජ්‍ය වෛද්‍ය විද්‍යාලය (Nizhny Novgorod State University) සමඟ ඒකාබද්ධව උපාධි පිරිනැමීමේ ආයතනයක් ශ්‍රී ලංකාව තුළ පිහිටුවීමට එම සමාගම අවසරය ඉල්ලා තිබේද;

(ii) ඒ සඳහා අවසර ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

(iv) අවසර ලබා දීමේ ලිපිය සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) South Asian Institute of Technology and Management නමැති සමාගම South Asian Institute of Technology and Medicine ලෙස සිය ආයතනයේ නම වෙනස් කළ බව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට දැනුම් දී තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

582/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2008.01.09 දින සිට 2008.04.09 දින දක්වා පැවති ආහාර හා ඖෂධ පරීක්ෂකවරු බඳවා ගැනීමේ ත්‍රෛමාසික පුහුණු පාඨමාලාවට සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපින, පළාත හා සේවා ස්ථාන කවරේද;

(iii) මෙම පාඨමාලාව අවසානයේ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වූ දින වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීමේ කඩඉම් ලකුණු කවරේද;

(v) එම ලකුණු ලබාගත් නිලධාරීන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) පරීක්ෂණය සමත් වූ නිලධාරීන්ට පත්වීම් ලබාදුන් දිනය එක් එක් නිලධාරියා අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2017 පෙබරවාරි මස 21 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— වරප්‍රසාද,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කේ. කාදර් මස්තාන් මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2016 දෙසැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

රේගු ආඥාපනත යටතේ යෝජනාව,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2017 පෙබරවාරි 08),— "(235 අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වගන්තිය යටතේ තීරුගාස්තු සම්බන්ධයෙන් 2017.01.24 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය. යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

(2016 නොවැම්බර් 10 දිනැති අංක 1992/26 දරන අති විශේෂ ගැසට් පත්‍රය.)"

*2.

විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2017 පෙබරවාරි 08),— "2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තියේ 3 උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 නොවැම්බර් 10 දිනැති අංක 1992/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*3.

සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2017 පෙබරවාරි 08),— "සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 22(2) වගන්තිය යටතේ, ප්‍රති-අපනයනය කිරීම සඳහා හෝ තීරුබදු රහිත සාප්පුවල විදේශ ව්‍යාවහාර මුදලට විකිණීම සඳහා ආනයනය කරනු ලබන විදේශීය මත්පැන් මත සුරාබදු අය නොකිරීම සම්බන්ධයෙන් 2016 ඔක්තෝබර් මස 04 දින සිට ක්‍රියාත්මක වන පරිදි මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 ඔක්තෝබර් මස 03 දිනැති අංක 1987/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.24 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය. යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

(අංක 990 දරන සුරාබදු නිවේදනය)"

*4.

දිවි නැගුම (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 142 වගන්තිය යටතේ මිල ඉහළ සීමා සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ඔක්තෝබර් මස 21 දින අංක 1989/61 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

6.

පා. 188/'16

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— බ්‍රසීලයෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ ඇමරිකා එක්සත් ජනපදයෙහි, නිව්යෝක් නුවර, එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත කාර්යාලය සඳහා කාර්යාල මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් ස්ථානය වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් දරන ලද වියදම පිළිබඳ සොයා බලා වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

(අ) බ්‍රසීලයෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ ඇමරිකා එක්සත් ජනපදයෙහි, නිව්යෝක් නුවර, එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත කාර්යාලය සඳහා කාර්යාල මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් ස්ථානය වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් දරන ලද වියදම කවරේද;

(ආ) මෙකී මිලදී ගැනීම් නිසි පරිදි අනුමත කොට තිබේද;

(ඇ) මෙකී එක් එක් ස්ථාන සඳහා වියදම් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ඈ) මෙකී ස්ථාන මිලදී ගැනීමට වගකිව යුතු හා / හෝ උපදෙස් දුන් නිලධාරීන් නම් වශයෙන් කවරේද;

(ඉ) සිය පරීක්ෂණ සඳහා අදාළ වන්නේ යැයි පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් සලකනු ලබන වෙනත් යම් කරුණක් සම්බන්ධයෙන් පරීක්ෂා කොට බලා වාර්තා කරනු පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) ගරු කථානායකවරයා විසින් කාරක සභාව සහ එහි සභාපතිවරයා නම් කළ යුතු ය.

(ආ) අංක 95 පාර්ලිමේන්තු ස්ථාවර නියෝගයෙහි කුමක් සඳහන්ව තිබුනද කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. එම කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමටද, පාර්ලිමේන්තුව හෝ එබඳු කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එබඳු පුද්ගලයන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපියක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂ්‍යකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට ද, කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් ප්‍රතිඥා හෝ දිවුරවනු ලැබූ සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සහාය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල්තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස හයක (06) කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබාදෙන අන් කවර කාල සීමාවක් තුළ හෝ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

*7.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— තානාපති වරප්‍රසාද පනත යටතේ නියමය,— 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4 වැනි වගන්තිය යටතේ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2016 ඔක්තෝබර් 05 දිනැති අංක 1987/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.11.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගය ලබාදීම පනත යටතේ නියමය,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ යුක්රේනයේ ආණ්ඩුව අතර සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය නෛතික සහයෝගය ලබාදීම පිළිබඳව ඇතිකර ගනු ලැබූ ගිවිසුම සම්බන්ධයෙන් 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනතේ 2 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් පනවනු ලදුව, 2016 නොවැම්බර් 11 දිනැති අංක 1992/78 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*9.

සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා,— ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නියෝග,— ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 අධිකාරය වූ) 63 වගන්තියේ (2) උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ 2013 ඉඩම් අත්කර ගැනීමේ (වන්දි ගෙවීම්) නියෝගවල 4(2) නියෝගය සංශෝධනය කරමින් ඉඩම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 නොවැම්බර් 18 දිනැති අංක 1993/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— සමාගම් පනත සහ සමිති ආඥාපනත යටතේ නියෝග,— 2007 අංක 7 දරන සමාගම් පනතේ 477 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 527 වගන්තිය යටතේ සහ 2005 අංක 11 දරන සමිති ආඥාපනත (සංශෝධන) සමඟ කියවිය යුතු (123 අධිකාරය වූ) 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 19 වගන්තිය යටතේ සමාගම් (ගාස්තු) සහ සමිති (ගාස්තු) සම්බන්ධයෙන් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016 ඔක්තෝබර් 25 දිනැති අංක 1990/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වන වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 නොවැම්බර් 11 දිනැති අංක 1992/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය,— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ යෝජිත ව්‍යාපෘතියට අදාළ නිදහස් කිරීම් සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 නොවැම්බර් 18 දිනැති අංක 1993/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.27 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 හා 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වගන්තියේ 3 උප වගන්තිය සහ 14 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 දෙසැම්බර් 30 දිනැති අංක 1999/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.27 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුමේ සීමාවන් ප්‍රතිශෝධනය කිරීම - 2016 (විෂය අංක - 01002),— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුමේ සීමාවන් ප්‍රතිශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද;

ඒ අනුව, අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීමට අත්තිකාරම් ගෙවීම සඳහා ඇස්තමේන්තුවේ දැනට අනුමත සීමාවන් පහත පරිදි වන හෙයින්ද:—

| | | |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | - | රු. 150,000,000.00 |
| අවම ලැබීම් සීමාව | - | රු. 5,000,000.00 |
| උපරිම හර ශේෂ සීමාව | - | රු. 275,000,000.00; |

2016 වර්ෂය සඳහා මෙම වැටලීම් ගිණුමේ අපේක්ෂිත ශේෂ පහත පරිදි වන හෙයින්ද:—

| | | |
|---|---|---|
| 2016.01.01 දිනට හර ශේෂය | - | රු. 19,340,031.98 |
| වර්ෂය සඳහා අපේක්ෂිත හර | - | රු. 150,000,000.00 |
| වර්ෂය සඳහා අපේක්ෂිත බැර | - | රු. 1,700,000.00 |
| 2016.12.31 දිනට අපේක්ෂිත හර ශේෂය | - | රු. 167,640,031.98 ; සහ |

පූර්ව වර්ෂයන්හිදී පවරන ලද නඩු අවසන් නොවීම හේතුවෙන් නඩු භාණ්ඩ වශයෙන් රඳවා මුදල් බැර කළ නොහැකි වීම මත ලැබීම් හි අඩු වීමක් සිදුව ඇති හෙයින්ද;

ඊට අනුකූලව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුමේ අවම ලැබීම් සීමාව රු.5,000,000.00 සිට රු.1,500,000.00 දක්වා අඩු කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ අග්‍රවිනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයන් සඳහා වන වැටුප් සංශෝධනය කිරීම සඳහා වූ යෝජනාව,— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව ප්‍රකාරව අග්‍රවිනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් සඳහා මාසික වැටුප් පාර්ලිමේන්තුව විසින් තීරණය කළ යුතු ය.

ඒ අනුව, අග්‍රවිනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්ගේ වැටුප් 2016.01.01 දින සිට 2020.01.01 දින දක්වා අදියර 05කින් ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කිරීමට යෝජනා ඉදිරිපත් කර ඇත.

එක් එක් තනතුරට අදාළ සම්පූර්ණ වැටුප් පරිමාණයන් පහත පරිදි වේ. (උපලේඛන I)

| | සේවා කාණ්ඩය | වැටුප් කේතය | ආරම්භක පියවර | අවුරුදු ගණන | පළමු පියවර | උපරිමය |
|---|---|---|---|---|---|---|
| 1 | අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයන් | JS 3 - 2016 | 131,500 | 5 | 6,575 | 164,375 |
| 2 | ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්/ අභියාචනාධිකරණයේ සභාපතිවරයා | JS 4 - 2016 | 135,000 | 5 | 6,750 | 168,750 |
| 3 | අග්‍රවිනිශ්චයකාරවරයා | JS 5 - 2016 | 145,000 | 5 | 7,250 | 181,250 |

නව වැටුප් පරිමාණයන් එක් එක් අදියරයන් යටතේ ක්‍රියාත්මක කිරීමට අදාළ වැටුප් පරිවර්තන වගු උපලේඛන II ලෙසද, වැටුප් පරිමාණයන් ක්‍රියාත්මක කිරීමට අදාළ උපදෙස් උපලේඛන III ලෙසද මේ සමඟ ඉදිරිපත් කරන අතර අග්‍රවිනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් සඳහා මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

උපලේඛන I

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව ප්‍රකාරව අග්‍රවිනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් සඳහා වැටුප් ව්‍යුහය - 2016**

| සේවා කාණ්ඩය | වැටුප් කේතය | වැටුප් පරිමාණය (රු.) |
|---|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරවරයා | JS 5 - 2016 | 145,000 - 5 x 7,250 - 181,250 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්/ අභියාචනාධිකරණයේ සභාපතිවරයා | JS 4 - 2016 | 135,000 - 5 x 6,750 - 168,750 |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් | JS 3 - 2016 | 131,500 - 5 x 6,575 - 164,375 |

අ/ක

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

**වැටුප් පරිමාණයන්**

වැටුප් පරිමාණයන්හි එක් එක් තීරුව මඟින් දැක්වෙන තොරතුරු මෙසේය.

1 තීරුව - අවුරුදු ගණන

2 තීරුව - සේවා කාලය

3 තීරුව - ශ්‍රේණිය

4 තීරුව - පත්වීමේදී සහ උසස් වීම ලැබුවේ නම්, ලැබෙන වැටුප් තලය

| සේවා ගණය | | | අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් | ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්/ අභියාචනාධිකරණයේ සභාපතිවරයා | අග්‍රවිනිශ්චයකාරවරයා |
|---|---|---|---|---|---|
| වැටුප් කේත අංකය | | | JS 3 - 2016 | JS 4 - 2016 | JS 5 - 2016 |
| 1 | 2 | 3 | 4 | 4 | 4 |
| | | | 6,575 | 6,750 | 7,250 |
| | | | 5 | 5 | 5 |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| 1 | | | 131,500 | 135,000 | 145,000 |
| 2 | | | 138,075 | 141,750 | 152,250 |
| 3 | | | 144,650 | 148,500 | 159,500 |
| 4 | | | 151,225 | 155,250 | 166,750 |
| 5 | | | 157,800 | 162,000 | 174,000 |
| 6 | | | 164,375 | 168,750 | 181,250 |

අ/ක

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

# වැටුප් පරිවර්තන වගු

**JS 3 – 2016**

උපලේඛන II

| වැටුප් පියවර | 2015.12.31 දිනට | | 2016.01.01 දිනට | | 2017.01.01 දිනට | | 2018.01.01 දිනට | | 2019.01.01 දිනට | | 2020.01.01 දිනට | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මූලික වැටුප (රු.) | දළ වැටුප (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) |
| 1 | 63,500 | 85,525 | 77,100 | 8,425 | 90,700 | - | 104,300 | - | 117,900 | - | 131,500 | - |
| 2 | 66,675 | 89,176 | 80,955 | 8,221 | 95,235 | - | 109,515 | - | 123,795 | - | 138,075 | - |
| 3 | 69,850 | 92,828 | 84,810 | 8,018 | 99,770 | - | 114,730 | - | 129,690 | - | 144,650 | - |
| 4 | 73,025 | 96,479 | 88,665 | 7,814 | 104,305 | - | 119,945 | - | 135,585 | - | 151,225 | - |
| 5 | 76,200 | 100,130 | 92,520 | 7,610 | 108,840 | - | 125,160 | - | 141,480 | - | 157,800 | - |
| 6 | 79,375 | 103,781 | 96,375 | 7,406 | 113,375 | - | 130,375 | - | 147,375 | - | 164,375 | - |

අ/ක

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

| වැටුප් පියවර | 2015.12.31 දිනට | | 2016.01.01 දිනට | | 2017.01.01 දිනට | | 2018.01.01 දිනට | | 2019.01.01 දිනට | | 2020.01.01 දිනට | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මූලික වැටුප (රු.) | දළ වැටුප (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) |
| 1 | 65,000 | 87,250 | 79,000 | 8,250 | 93,000 | - | 107,000 | - | 121,000 | - | 135,000 | - |
| 2 | 68,250 | 90,988 | 82,950 | 8,038 | 97,650 | - | 112,350 | - | 127,050 | - | 141,750 | - |
| 3 | 71,500 | 94,725 | 86,900 | 7,825 | 102,300 | - | 117,700 | - | 133,100 | - | 148,500 | - |
| 4 | 74,750 | 98,463 | 90,850 | 7,613 | 106,950 | - | 123,050 | - | 139,150 | - | 155,250 | - |
| 5 | 78,000 | 102,200 | 94,800 | 7,400 | 111,600 | - | 128,400 | - | 145,200 | - | 162,000 | - |
| 6 | 81,250 | 105,938 | 98,750 | 7,188 | 116,250 | - | 133,750 | - | 151,250 | - | 168,750 | - |

අ/ක

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

| වැටුප් පියවර | 2015.12.31 දිනට | | 2016.01.01 දිනට | | 2017.01.01 දිනට | | 2018.01.01 දිනට | | 2019.01.01 දිනට | | 2020.01.01 දිනට | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මූලික වැටුප (රු.) | දළ වැටුප (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) |
| 1 | 70,000 | 93,000 | 85,000 | 8,000 | 100,000 | - | 115,000 | - | 130,000 | - | 145,000 | - |
| 2 | 73,500 | 97,025 | 89,250 | 7,775 | 105,000 | - | 120,750 | - | 136,500 | - | 152,250 | - |
| 3 | 77,000 | 101,050 | 93,500 | 7,550 | 110,000 | - | 126,500 | - | 143,000 | - | 159,500 | - |
| 4 | 80,500 | 105,075 | 97,750 | 7,325 | 115,000 | - | 132,250 | - | 149,500 | - | 166,750 | - |
| 5 | 84,000 | 109,100 | 102,000 | 7,100 | 120,000 | - | 138,000 | - | 156,000 | - | 174,000 | - |
| 6 | 87,500 | 113,125 | 106,250 | 6,875 | 125,000 | - | 143,750 | - | 162,500 | - | 181,250 | - |

අ/ක

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

ඇමුණුම I

වැටුප් පරිවර්තන ආදර්ශ ලිපිය

මගේ අංකය:

දිනය:

නම:

තනතුර:

**<u>කළමනාකරණ සේවා චක්‍රලේඛ......................................... අනුව 2016.01.01 දිනට</u>**

**<u>වැටුප් පරිවර්තනය කිරීම</u>**

යථෝක්ත චක්‍රලේඛය පරිදි ඔබගේ වැටුප 2016.01.01 දිනට පහත සඳහන් පරිදි පරිවර්තනය කරනු ලැබේ.

1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 වර්ගීකරණය අනුව 2015.12.31 දිනට අදාළ

| | | |
|---|---|---|
| (අ) | සේවා ශ්‍රේණිය | : |
| (ආ) | වැටුප් කේතය | : |
| (ඇ) | වැටුප් පරිමාණය | : |
| (ඈ) | වැටුප් පියවර | : |
| (ඉ) | වැටුප් තලය | : රු. |
| (ඊ) | අවසාන වැටුප් වර්ධකය ලද දිනය | : |

2. කළමණාකරණ සේවා චක්‍රලේඛ....................... වර්ගීකරණය අනුව 2016.01.01 දිනට උපලේඛන I අනුව

| | | |
|---|---|---|
| (අ) | සේවා ශ්‍රේණිය | : |
| (ආ) | වැටුප් කේතය | : |
| (ඇ) | වැටුප් පරිමාණය | : |
| (ඈ) | වැටුප් පියවර | : |
| (ඉ) | වැටුප් තලය | : රු. |

3. උපලේඛන II අනුව 2016.01.01 දින සිට ගෙවිය යුතු වැටුප

| | | |
|---|---|---|
| (අ) | මූලික වැටුප | : රු. |
| (ආ) | වැටුපෙහි ගැලපුම් දීමනාව | : රු. |

4. සාවද්‍ය වර්ගීකරණයකින් හෝ ගණනය කිරීමකින් හෝ වෙනත් වරදක් හේතුවෙන් හෝ වැඩිපුර ගෙවීමක් සිදුවී ඇති බව අනාවරණය වුවහොත් එම මුදල් ආපසු අයකිරීමට යටත් වන බවද දන්වමි.

| | | | |
|---|---|---|---|
| සකස් කළේ: | අත්සන: .................................... | පරීක්ෂා කළේ: | අත්සන: .................................... |
| | නම: .................................... | | නම: .................................... |
| | තනතුර: .................................... | | තනතුර: .................................... |
| | දිනය: .................................... | | දිනය: .................................... |

අනුමත කළේ: අත්සන: ....................................

නම: ....................................

තනතුර: ....................................

දිනය: ....................................

නිල මුද්‍රාව: ....................................

පිටපත්: 1. ....................................

2. ....................................

ඇමුණුම II

වැටුප් පරිවර්තන ආදර්ශ ලිපිය

මගේ අංකය:

දිනය:

නම:

තනතුර:

<u>**කළමනාකරණ සේවා චක්‍රලේඛ......................................... අනුව 2017.01.01 දිනට**</u>

<u>**වැටුප් පරිවර්තනය කිරීම**</u>

යථෝක්ත චක්‍රලේඛය පරිදි ඔබගේ වැටුප 2017.01.01 දිනට පහත සඳහන් පරිදි පරිවර්තනය කරනු ලැබේ.

1. කළමනාකරණ සේවා චක්‍රලේඛ..................... වර්ගීකරණය අනුව 2016. 12. 31 දිනට අදාළ

   (අ) සේවා ගණය :

   (ආ) වැටුප් කේතය :

   (ඇ) වැටුප් පරිමාණය :

   (ඈ) උපලේඛන I අනුව අනුරූපී වැටුප :

   (ඉ) උපලේඛන II අනුව ලද වැටුප් පියවර :

   (ඊ) උපලේඛන II අනුව ලද වැටුප් තලය : රු.

   (උ) අවසාන වැටුප් වර්ධකය ලද දිනය :

2. උපලේඛන II අනුව 2017.01.01 දින සිට ගෙවිය යුතු වැටුප: රු.

3. සාවද්‍ය වර්ගීකරණයකින් හෝ ගණනය කිරීමකින් හෝ වෙනත් වරදක් හේතුවෙන් හෝ වැඩිපුර ගෙවීමක් සිදුවී ඇති බව අනාවරණය වුවහොත් එම මුදල් ආපසු අයකිරීමට යටත් වන බවද දන්වමි.

සකස් කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................

පරීක්ෂා කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................

අනුමත කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................
නිල මුද්‍රාව: ....................................

පිටපත්: 1. ....................................
2. ....................................

ඇමුණුම III

වැටුප් පරිවර්තන ආදර්ශ ලිපිය

මගේ අංකය:

දිනය:

නම:

තනතුර:

**<u>කළමනාකරණ සේවා චක්‍රලේඛ........................................ අනුව 2018.01.01 දිනට</u>**

**<u>වැටුප් පරිවර්තනය කිරීම</u>**

යථෝක්ත චක්‍රලේඛය පරිදි ඔබගේ වැටුප 2018.01.01 දිනට පහත සඳහන් පරිදි පරිවර්තනය කරනු ලැබේ.

1. කළමනාකරණ සේවා චක්‍රලේඛ..................... වර්ගීකරණය අනුව 2017.12.31 දිනට අදාළ

| | | |
|---|---|---|
| (අ) | සේවා ගණය | : |
| (ආ) | වැටුප් කේතය | : |
| (ඇ) | වැටුප් පරිමාණය | : |
| (ඈ) | උපලේඛන I අනුව අනුරූපී වැටුප | : |
| (ඉ) | උපලේඛන II අනුව ලද වැටුප් පියවර | : |
| (ඊ) | උපලේඛන II අනුව ලද වැටුප් තලය | : රු. |
| (උ) | අවසාන වැටුප් වර්ධකය ලද දිනය | : |

2. උපලේඛන II අනුව 2018.01.01 දින සිට ගෙවිය යුතු වැටුප: රු.

3. සාවද්‍ය වර්ගීකරණයකින් හෝ ගණනය කිරීමකින් හෝ වෙනත් වරදක් හේතුවෙන් හෝ වැඩිපුර ගෙවීමක් සිදුවී ඇති බව අනාවරණය වුවහොත් එම මුදල් ආපසු අයකිරීමට යටත් වන බවද දන්වමි.

සකස් කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................

පරීක්ෂා කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................

අනුමත කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................
නිල මුද්‍රාව: ....................................

පිටපත්: 1. ....................................
2. ....................................

ඇමුණුම IV

වැටුප් පරිවර්තන ආදර්ශ ලිපිය

මගේ අංකය:

දිනය:

නම:

තනතුර:

**කළමනාකරණ සේවා චක්‍රලේඛ......................................... අනුව 2019.01.01 දිනට**

**වැටුප් පරිවර්තනය කිරීම**

යථෝක්ත චක්‍රලේඛය පරිදි ඔබගේ වැටුප 2019.01.01 දිනට පහත සඳහන් පරිදි පරිවර්තනය කරනු ලැබේ.

1. කළමනාකරණ සේවා චක්‍රලේඛ..................... වර්ගීකරණය අනුව 2018.12.31 දිනට අදාළ

(අ) සේවා ගණය :

(ආ) වැටුප් කේතය :

(ඇ) වැටුප් පරිමාණය :

(ඈ) උපලේඛන I අනුව අනුරූපී වැටුප :

(ඉ) උපලේඛන II අනුව ලද වැටුප් පියවර :

(ඊ) උපලේඛන II අනුව ලද වැටුප් තලය : රු.

(උ) අවසාන වැටුප් වර්ධකය ලද දිනය :

2. උපලේඛන II අනුව 2019.01.01 දින සිට ගෙවිය යුතු වැටුප: රු.

3. සාවද්‍ය වර්ගීකරණයකින් හෝ ගණනය කිරීමකින් හෝ වෙනත් වරදක් හේතුවෙන් හෝ වැඩිපුර ගෙවීමක් සිදුවී ඇති බව අනාවරණය වුවහොත් එම මුදල් ආපසු අයකිරීමට යටත් වන බවද දන්වමි.

සකස් කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................

පරීක්ෂා කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................

අනුමත කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................
නිල මුද්‍රාව: ....................................

පිටපත්: 1. ....................................
2. ....................................

ඇමුණුම V

වැටුප් පරිවර්තන ආදර්ශ ලිපිය

මගේ අංකය:

දිනය:

නම:

තනතුර:

**<u>කළමනාකරණ සේවා චක්‍රලේඛ......................................... අනුව 2020.01.01 දිනට</u>**

**<u>වැටුප් පරිවර්තනය කිරීම</u>**

යථෝක්ත චක්‍රලේඛය පරිදි ඔබගේ වැටුප 2020.01.01 දිනට පහත සඳහන් පරිදි පරිවර්තනය කරනු ලැබේ.

1. කළමනාකරණ සේවා චක්‍රලේඛ..................... වර්ගීකරණය අනුව 2019.12.31 දිනට අදාළ

   (අ) සේවා ගණය :

   (ආ) වැටුප් කේතය :

   (ඇ) වැටුප් පරිමාණය :

   (ඈ) උපලේඛන I අනුව අනුරූපී වැටුප :

   (ඉ) උපලේඛන II අනුව ලද වැටුප් පියවර :

   (ඊ) උපලේඛන II අනුව ලද වැටුප් තලය : රු.

   (උ) අවසාන වැටුප් වර්ධකය ලද දිනය :

2. උපලේඛන II අනුව 2020.01.01 දින සිට ගෙවිය යුතු වැටුප: රු.

3. සාවද්‍ය වර්ගීකරණයකින් හෝ ගණනය කිරීමකින් හෝ වෙනත් වරදක් හේතුවෙන් හෝ වැඩිපුර ගෙවීමක් සිදුවී ඇති බව අනාවරණය වුවහොත් එම මුදල් ආපසු අයකිරීමට යටත් වන බවද දන්වමි.

සකස් කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................

පරීක්ෂා කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................

අනුමත කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................
නිල මුද්‍රාව: ....................................

පිටපත්: 1. ....................................
2. ....................................

උපලේඛන III

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව ප්‍රකාරව අග්‍රවිනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් සඳහා වැටුප් ව්‍යුහය - 2016**

2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 සහ ඊට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන යටතේ අග්‍රවිනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් සඳහා ක්‍රියාත්මක වන වැටුප් පරිමාණයන් වෙනුවට මෙම චක්‍රලේඛයේ උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණයන් 2016.01.01 දින සිට අදියර 05කින් උපලේඛන II හි සඳහන් පරිදි ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර ඇත.

**02.** **නව වැටුප් ව්‍යුහය තුළ පහත සඳහන් දීමනා අන්තර්ගත කර ඇත.**

(i) 2011.12.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 31/2011 සහ 2012.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2012 අනුව ගෙවනු ලබන විශ්‍රාම වැටුපට හිමිකම් රහිත විශේෂ දීමනාව.

(ii) 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/2014, 2014.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/2014(1) සහ 2015.02.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2015 අනුව මාසිකව ගෙවනු ලබන රු.10,000 ක් වන අන්තර් දීමනාව.

**03.** වැටුප් පරිවර්තනය

03.1 දැනට පවතින වැටුප් පරිමාණයන්හි සිට නව වැටුප් පරිමාණයන්ට වැටුප් පරිවර්තනය කිරීම පියවරට පියවර තැබීමේ ක්‍රමය යටතේ සිදු කළ යුතුය. එහෙත් මෙම වැටුප් සංශෝධනය අදියර 05ක් යටතේ සිදු කරන බැවින් උපලේඛන II හි සඳහන් පරිවර්තන වගුව අනුව වැටුප් පරිවර්තනය කළ යුතුය.

03.2 වැටුප් පරිවර්තන සැකසීමේ පහසුව සඳහා උපලේඛන I හි සඳහන් සෑම වැටුප් පරිමාණයක් සඳහාම වෙන් වෙන් වශයෙන් පරිවර්තන වගු උපලේඛන II හි දක්වා ඇත.

03.3 වැටුප් පරිවර්තනය කිරීමේ දී 2015.12.31 දිනට පවත්නා වැටුප් ව්‍යුහය යටතේ අදාළ වන වැටුප් කේතය පළමුව හඳුනා ගත යුතුය. ඒ අනුව මෙම චක්‍රලේඛයේ උපලේඛන I හි සඳහන් අනුරූපී වැටුප් කේතය සහ ඊට අදාළ උපලේඛන II හි සඳහන් පරිවර්තන වගුව තෝරාගත යුතු ය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි සඳහන් වැටුප් කේතයන්ට අනුරූපී මෙම චක්‍රලේඛය යටතේ වන නව වැටුප් කේතයන් පහත පරිදි වේ.

| **රා. ප. ච. 06/2006 අනුව වැටුප් කේතය** | **නව වැටුප් කේතය** |
|---|---|
| SF. 4 - 2006 | JS. 5 - 2016 |
| SF. 2 - 2006 | JS. 4 - 2016 |
| SF. 1 - 2006 | JS. 3 - 2016 |

03.4 නියමිත පරිවර්තන වගුව අනුව 2015.12.31 දිනට අදාළ වූ වැටුප් පියවරට අනුරූපී 2016.01.01 දිනට නියමිත වැටුප් පියවර අනුව අදාළ වන වැටුප් තලයෙහි පිහිටුවිය යුතුය. මේ සඳහා මෙම චක්‍රලේඛයේ ඇමුණුම I වශයෙන් ඇති වැටුප් පරිවර්තන ආකෘතිය උපයෝගී කර ගත යුතුය.

03.5 ඉහත 03.4 හි අනුගමනය කළ ක්‍රමවේදය අනුවම 2017.01.01, 2018.01.01, 2019.01.01 සහ 2020.01.01 යන දිනයන්හි දී එළඹෙන වැටුප් පරිවර්තනයන් ද සිදුකළ යුතුය. මේ සඳහා උපලේඛන IIහි එක් එක් වර්ෂය යටතේ සඳහන් කර ඇති වැටුප් තලයන් අදාළ කරගත යුතුය. මෙම පරිවර්තනය සඳහා එක් එක් වර්ෂය වෙනුවෙන් ඇමුණුම II, III, IV සහ V වශයෙන් ඇති වැටුප් පරිවර්තන ආකෘති උපයෝගී කර ගත යුතුය.

## 04. වැටුප් වර්ධකය ගණනය කිරීම

04.1 වැටුප් පරිමාණය තුළ වැටුප් වර්ධක ගණනය කිරීම

2016.01.01 දින සිට 2016.12.31 දක්වා වූ කාලය තුළ වැටුප් වර්ධකය උපයා ගන්නා අවස්ථාවේ දී ඉහත 03.4 හි පිහිටුවන ලද වැටුප් තලයට ආසන්න ඉහළ වැටුප් තලයේ පිහිටුවිය යුතුය. ඒ අනුව 2016 වර්ෂයට නියමිත වැටුප් වර්ධකයේ වටිනාකම ලෙස සැලකිය යුත්තේ අදාළ වැටුප් තලයන් දෙක අතර වෙනස වේ.

04.2 වැටුප් පරිමාණයේ උපරිමයෙන් ඔබ්බට වැටුප් වර්ධක ලබාදීම.

(අ) වැටුප් පරිමාණයක උපරිමයට පැමිණ ඇති විට 2016.01.01 දින සිට අදාළ විය යුතු වැටුප් තලය තීරණය කිරීම සඳහා උපලේඛන II හි අදාළ වැටුප් පරිවර්තන වගුවෙහි නියමිත තීරුවෙහි වැටුප් පරිමාණයේ අවසානයට ඇති වැටුප් තල දෙක අතර වෙනස වැටුප් වර්ධකය ලෙස සලකා වැටුප් පියවර ගණනය කළ යුතුය.

(ආ) 2016.01.01 දිනෙන් පසුව වැටුප් පරිමාණයක උපරිමය ඉක්මවා වැටුප් වර්ධක උපයාගන්නා අවස්ථාවක දී ද ඉහත (අ) හි පරිදි අදාළ වැටුප් පියවර ගණනය කළ යුතුය.

## 05. දළ වැටුපෙහි ගැලපුම් දීමනාව

05.1 මූලික වැටුපට අමතරව ඉහත 02 ඡේදයෙහි සඳහන් දීමනා සමඟ 2015.12.31 දිනට ලද දළ වැටුප සහ මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් එක් එක් වර්ෂයට අදාළ මූලික වැටුප අතර වෙනස දළ වැටුපෙහි ගැලපුම් දීමනාවක් ලෙස ගණනය කොට එහි ඇතුළත් කර ඇත. ඒ අනුව එක් එක් වර්ෂය සඳහා නියමිත මූලික වැටුපට අමතරව ඊට අනුරූපී ගැලපුම් දීමනාව ද ගෙවිය යුතුය. මෙම ගැලපුම් දීමනාව මෙහි පහත 16 හි සඳහන් කාර්යය හැර වෙනත් කිසිදු කාර්යයක් සඳහා වැටුපෙහි කොටසක් වශයෙන් නොසැලකිය යුතුය.

05.2 ඉහත 04.2 හි පරිදි උපරිමයෙන් ඔබ්බට වැටුප් පියවර ගණනය කළ අවස්ථාවකදී එම පියවරට අදාළ දළ වැටුපෙහි ගැලපුම් දීමනාව ද ගෙවිය යුතුය. මේ සඳහා පළමුව 2015.12.31 දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හෝ ඊට සංශෝධන වශයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ යටතේ ලැබූ වැටුප් තලය හා මෙම චක්‍රලේඛයේ දෙවන ඡේදයේ සඳහන් චක්‍රලේඛ යටතේ හිමි දීමනාවන් පමණක් ඇතුළත් දළ වැටුප ගණනය කළ යුතුය. එම වැටුප හා ඉහත 04.2 යටතේ ගණනය කරන ලද වැටුප් තලය අතර මූල්‍යමය අවාසියක් වන්නේ නම්, එම අගය දළ වැටුපෙහි ගැලපුම් දීමනාවක් වශයෙන් නියමිත වැටුප් තලය සමඟ ගෙවිය යුතුය.

**06. උසස්වීමක දී වැටුප් පරිවර්තනය කිරීම.**

මෙම අදියර ක්‍රමය යටතේ වැටුප් පරිවර්තනය සිදු කරනු ලබන කාල සීමාව තුළ (2016.01.01 සිට 2020.01.01 දක්වා) උසස්වීම් ලබන අවස්ථාවකදී එම උසස්වීම්වලට අදාළ වැටුප් පරිවර්තනයන්හිදී අදාළ කර ගත යුත්තේ උපලේඛන II හි සඳහන් එම උසස්වීම ක්‍රියාත්මක වන වර්ෂයට අදාළ තීරුවෙහි දැක්වෙන වැටුප් තලයන් වේ.

**07. අනෙකුත් දීමනා**

07.1 මෙම චක්‍රලේඛයේ දෙවන ඡේදයෙහි සඳහන් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මඟින් ලබා දී ඇති දීමනා අන්තර්ගත කරමින් නව වැටුප් ව්‍යුහය සකස් කර ඇති බැවින් 2016.01.01 දින සිට එම දීමනා ගෙවීම නතර කළ යුතුය.

07.2 අංක 37/2013 හා 2013.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ගෙවනු ලබන මසකට රු.7,800 ක් වන ජීවන වියදම් දීමනාව තවදුරටත් ගෙවිය යුතුය.

**08. විශ්‍රාම වැටුප්**

08.1 මෙම චක්‍රලේඛයේ වැටුප් ව්‍යුහය මත 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ලබන්නන් සඳහා විශ්‍රාම වැටුප ගණනය කිරීමේදී අදාළ කරගත යුත්තේ උපලේඛන II හි සඳහන් පරිදි අවසානවරට ලද වැටුප් පියවර විය යුතුය.

08.2 උපලේඛන I හි සඳහන් වැටුප් පරිමාණයන් 2020.01.01 දින සිට සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මකවීමත් සමඟම 2016.01.01 දින සේවයේ සිට ඉන්පසුව විශ්‍රාම ලැබූවන්ගේ විශ්‍රාම වැටුප ද ඒ අනුව සංශෝධනය කරනු ලබන අතර ඒ සම්බන්ධ උපදෙස් පසුව නිකුත් කරනු ලැබේ. 2016.01.01 දින සිට 2019.12.31 දක්වා අතර කාලය තුළ දී විශ්‍රාම වැටුප් සංශෝධනයන් සිදු කරනු නොලැබේ.

08.3 අංක 05/2015 දරන 2015.02.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව විශ්‍රාමිකයන් සඳහා ගෙවනු ලබන මසකට රු.3,500 ක් වන අන්තර් දීමනාව මෙම චක්‍රලේඛය යටතේ 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ගනු ලබන්නන් සඳහා නොගෙවිය යුතුය. එහෙත් අංක 37/2013 සහ 2013.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව විශ්‍රාමිකයන් සඳහා ගෙවනු ලබන මසකට රු.3,525 ක් වන ජීවන වියදම් දීමනාව ගෙවිය යුතුය.

**09. වැටුපෙහි ප්‍රතිශතයක් වශයෙන් ගෙවනු ලබන දීමනා**

වැටුපෙහි ප්‍රතිශතයක් වශයෙන් ගෙවනු ලබන දීමනා 2015.12.31 දිනට පැවති මූල්‍යමය අගයට සීමා කළ යුතුය. 2016.01.01 දිනට පසු මෙම චක්‍රලේඛය මඟින් ආවරණය වන තනතුරකට පත්කරනු ලබන විටක මෙම දීමනාව ගණනය කිරීම සඳහා එම තනතුරට 2015.12.31 දිනට හිමිව තිබූ වැටුප පදනම් කරගත යුතුය.

**10.** **පත්වීම් ලිපිවල වැටුප් පරිමාණය සඳහන් කිරීම**

මෙම චක්‍රලේඛයේ සඳහන් වැටුප් ව්‍යුහය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන 2020.01.01 දින දක්වා සිදු කරනු ලබන බඳවාගැනීම් / උසස් කිරීම් වලදී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණය සඳහන් කිරීමේදී උපලේඛන I හි සඳහන් නියමිත වැටුප් පරිමාණය අදාළ කරගත යුතුය. එහෙත් ගෙවීම් සිදුකළ යුත්තේ උපලේඛන II හි සඳහන් පරිදි විය යුතු බැවින් ඒ බැව් ද එම පත්වීම් ලිපිවල සඳහන් කළ යුතුය.

**11.** **තනතුරු / සේවා වර්ගීකරණය**

අධිකරණ නිලධාරීන් 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උපලේඛන III හි තනතුරු වර්ගීකරණය අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමට සමාන වන අතර මාණ්ඩලික නිලධාරීන් ලෙස සැලකේ.

**12.** **වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල්**

වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා දායක මුදල් අයකිරීමේ ප්‍රතිශතය 7%ක් වශයෙන් තවදුරටත් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතු අතර මේ සඳහා උපලේඛන II හි ඒ ඒ වර්ෂය යටතේ සඳහන් මූලික වැටුප අදාළ කරගත යුතුය.

**13.** **වැටුප් වර්ධක දිනය**

මෙම වැටුප් සංශෝධනය හේතුවෙන් වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ.

**14.** **වැටුප් පරිමාණයක උපරිමයෙන් ඔබ්බට වැටුප් වර්ධක ගෙවීම**

වැටුප් පරිමාණයක උපරිමයට පැමිණි නිලධාරීන්ට ඔවුන් විශ්‍රාම යන දින තෙක් හෝ වෙනත් වැටුප් පරිමාණයක් අදාළවන වෙනත් තනතුරට පත්වන / උසස්වන තුරු තවදුරටත් වැටුප් වර්ධකය ලබාදිය හැකිය.

**15.** **සංයුක්ත දීමනාව**

සංයුක්ත දීමනාව රු. 500 ක් වේ.

**16.** **ණය / අත්තිකාරම් ලබා දීමේ දී මාසික අඩු කිරීම්වල එකතුවේ සීමාව**

ණය අත්තිකාරම් ලබා ගැනීමේ දී සලකා බලනු ලබන 40% සීමාව ගණනය කිරීමේදී උපලේඛන II හි සඳහන් එදිනට අදාළ මූලික වැටුප හා ගැලපීමේ දීමනාවද අදාළ කරගත යුතුය.

**17.** **පොදු උපදෙස්**

මෙම චක්‍රලේඛය අනුව 2016.01.01 දිනට හිමි විය යුතු වැටුප තීරණය කිරීමේදී 2006.01.01 දින හෝ එදිනට පසුව සිදු කළ වැටුප් සංශෝධන අනුව වැටුප් සැකසීම සහ අදාළ වැටුප් පරිවර්තන නිවැරදිව සිදු කර ඇති බවට අදාළ බලධරයන් තහවුරු කර ගත යුතුය.

**18.** **වැඩිපුර ගෙවීම්**

මෙම උපදෙස් වැරදි ලෙස නිර්වචනය කිරීම හේතුවෙන් හෝ ලියවිලිවල වැරදීමක් හේතුවෙන් හෝ ගණනය කිරීමේදී ඇතිවන වැරදීමක් හේතුවෙන් හෝ වෙනත් වැරදීමක් හේතුවෙන් හෝ කිසියම් නිලධරයෙකුට වැඩිපුර මුදලක් ගෙවා ඇත්නම්, එවැනි වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු ගෙවීමට එම නිලධරයා බැඳී සිටී.

**19.** **පැහැදිලි කර ගැනීම් හා වැඩිදුර උපදෙස්**

මෙම චක්‍රලේඛයේ විධිවිධාන පිළිබඳව පැහැදිලි කිරීම් හා වැඩිදුර උපදෙස් අපේක්ෂා කරන්නේ නම්, එවැනි ඉල්ලීම්, භාණ්ඩාගාරයේ ලේකම්, මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01 වෙත යොමු කළ යුතුය.

*20.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*21.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

22.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

23.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

24.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

25.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

26.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**